Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- :- ගණිතය

සතිය- 8 (3 වාරය)

ශ්‍රේණිය:- 8

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

(ඉගෙනුම් කාලය :- පැය 2 )

# ත්‍රිකෝණ නිර් මාණය

26.3 සමද්විපාද ත්‍රිකෝණ නිර් මාණය

- ත්‍රිකෝණයක පාද දෙකක් දිගින් සමාන නම්, එවැනි ත්‍රිකෝණයක් සමද්විපාද ත්‍රිකෝණයක් ලෙස හැඳින්වේ.
- PQ= 6cm වූද PR හා QR පාද වල දිග 4cm බැගින් වන PQR සමද්විපාද ත්‍රිකෝණය පහත පියවර අනුගමනය කරමින් නිර් මාණය කරන්න
    1. 6cm ට වඩා වැඩි දිගක් සහිත සරල රේඛා ඛණ්ඩයක් නිර් මාණය කරන්න. එහි එක් අන්තයක ලක්ෂ්‍යයක් ලකුණු කර P ලෙස නම් කරන්න.
    2. කවකටුව 6cm ලෙස සකස් කරගෙන P හි තුඩ තබා සරල රේඛාව මත චාපයක් ලකුනු කර ඡේදන ලක්ෂ්‍යය Q ලෙස නම් කරන්න.
    3. කවකටු දුර 4 cm ලෙස සකස් කර ගෙන කවකටුවේ තුඩ P හි තබා රේඛාවට ඉහලින් චාපයක් අඳින්න. නැවත කවකටු තුඩ Q හි තබා පෙර ඇඳි චාපය කැපෙන සේ චාපයක් අඳින්න.
    4. චාප දෙක ඡේදනය වන ලක්ෂ්‍යය R ලෙස නම් කර, PR හා QR යා කර PQR ත්‍රි කෝණය සම්පූර් ණ කරන්න.

26.4 විෂම ත්‍රිකෝණයක් නිර් මාණය

- ත්‍රිකෝණයක පාද තුන දිගින් එකිනෙකට අසමාන නම්, එවැනි ත්‍රිකෝණයක් විෂම ත්‍රි කෝණයක් ලෙස හඳුන්වයි.
- පෙළ පොතේ 121,122 පිටු අධ්‍යයනය කරමින් AB= 6cm, BC= 5 cm සහ AC= 3 cm වන ABC විෂම ත්‍රිකෝණය නිර් මාණය කරන්න.
- 119,120,121,122 පිටු අධ්‍යයනය කර 26.2 අභ්‍යාසය කරන්න.